www.agaram.lk 126

3

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව - I

නම/විභාග අංකය :- ...................................................... කාලය: පැය 01 යි.

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- 01 සිට 04 තෙක් ප්‍රශ්න සඳහා පහත ගීත කොටස් ආශ්‍රිත ව පිළිතුරු සපයන්න.

A. ගල්ලෙන බිඳලා - ලෙන් දොර ඇරලා
සිංහබා... සිංහබා ... සිංහබා...

B. දී කිරි දී කිරි ගෙනාවා දී කිරි
මිහිපිට කාටාත් ගුණ දෙන දී කිරි

C. හනික වරෙව් කොල්ලනේ - මෙන්න මෙහෙ වරෙව්
තොපට හරිම වාසියක් - මෙන්න මෙහෙ වරෙව්

D. සෝබාව දේ මෙපුර සිරි විසිතුරු - බලනු මිතුරු මඟ පියකරු වූ
සුසුදු වලා කැරලි පලසකිමේ මඟ දිග ඇති රූ අහස පූරන මැදුරු

E. ප්‍රේමයෙන් මන රංජිත වේ නන්දිත වේ
පුෂ්පයෙන් වන සුන්දර වේ ලංකෘත වේ

(01) නාට්‍ය ධර්මී සම්ප්‍රදාය අනුව ලංකාවේ නිර්මාණය වූ නාට්‍ය දෙකක අන්තර්ගත ගීත කණ්ඩ වනුයේ,
(1) A සහ E (2) A සහ D (3) E සහ B (4) A සහ D

(02) "රතු හැට්ටකාරි" වේදිකා නාට්‍යයේ ගීත ඛණ්ඩයකි.
(1) D (2) E (3) B (4) C

(03) ලූෂන් බුලත්සිංහල මහතා විසින් නිර්මාණය කරන ලද වේදිකා නාට්‍ය හා සම්බන්ධ ගිත වනුයේ,
(1) A සහ E (2) B සහ D (3) C සහ D (4) B සහ E

(04) "C" අක්ෂරය හා සම්බන්ධ නාට්‍ය ගීතය සම්බන්ධයෙන් වඩාත් ගැළපෙනුයේ,
(1) මනමේ - එදිරිවීර සරත්චන්ද්‍ර (2) ගුරුතරුව - ජයලත් මනෝරත්න
(3) හුණුවටයේ කථාව - හෙන්රි ජයසේන (4) බෙරහඬ - බන්දුල ජයවර්ධන

(05) ශ්‍රව්‍ය දෘශ්‍ය කලා මාධ්‍යයක් වනුයේ,
(1) මූර්ති (2) චිත්‍ර (3) නව කතාව (4) ඔපෙරා

(06) නළුවෙක් විසින් චරිතයක් නිරූපණයේ දී එම චරිතයට ප්‍රවිශ්ඨ වීම හඳුන්වන්නේ,
(1) අනුකරණය යනුවෙනි. (2) අනුරූපණය යනුවෙනි.
(3) සමාරෝපය යනුවෙනි. (4) අභිරූපණය යනුවෙනි.




Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(07) පුද්ගලයකුගේ චරිත ස්වභාවයක්, අවස්ථාවක්, ක්‍රියාවක් ඒ අයුරින් ම ඉදිරිපත් කිරීම හඳුන්වන්න.
(1) අභිනය යනුවෙනි.
(2) අනුකරණය යනුවෙනි.
(3) සමාරෝපය යනුවෙනි.
(4) ආවේශය යනුවෙනි.

(08) වාචික අභිනය භාවිතා නොවන කලා මාධ්‍ය වනුයේ,
(1) ඔපෙරා සහ අභිරූපණ රංගන
(2) අභිරූපණ රංගන සහ මුද්‍රා නාට්‍ය
(3) බැලේ නාට්‍ය හා අභිරූපණ රංගන
(4) මුද්‍රා නාට්‍ය හා ඔපෙරා

- 09 සහ 10 ප්‍රශ්න සඳහා පහත රූප සටහන භාවිත කරන්න.




(09) මෙම වේදිකාවේ මනඃකල්පිත බෙදීම් අනුව A සහ B කොටස් පිළිවෙලින්,
(1) දකුණ උඩ වේදිකාව සහ වම උඩ වේදිකාව ය.
(2) වම උඩ වේදිකාව සහ දකුණ යට වේදිකාව ය.
(3) දකුණ යට වේදිකාව හා වම උඩ වේදිකාව ය.
(4) දකුණ උඩ වේදිකාව සහ වම යට වේදිකාව ය.

(10) C හා D අක්ෂර පිළිවෙලින් වනුයේ,
(1) දකුණු පස සහ පහළ වේදිකාව ය.
(2) දකුණු පස සහ ඉහළ වේදිකාව ය.
(3) වම්පස සහ පහළ වේදිකාව ය.
(4) වම්පස සහ ඉහළ වේදිකාව ය.

(11) වේදිකා නාට්‍යයක නළුවෙක් ආබාධිතයකු සේ කකුලක් කොර ගසමින් ඇවිදින ලදී. මෙය,
(1) රිද්මයානුකූල චලනයකි.
(2) නිර්මිත චලනයකි.
(3) ස්වාභාවික චලනයකි.
(4) තාලානුකූල චලනයකි.

(12) චරිතයකට ආරෝපණය වී කිසියම් කාලයක් එහි ජීවත්වීම රූපණය නම් වේ. රූපණයේ දී නලුවන් ප්‍රගුණ කළ යුතු අංශ දෙක වනුයේ,
(1) මස් පිඩු වර්ධනය හා සමේ වර්ණය පිළිබඳව යි.
(2) අභ්‍යන්තරික ප්‍රකාශනය හා බාහිර ප්‍රකාශනය යි.
(3) අනුකරණය හා සමාරෝපය යි.
(4) ඇඳුම් මෝස්තරකරණය හා කොණ්ඩා මෝස්තර කරණය යි.

(13) සාර්ථක නළුවෙක් වීම සඳහා අත්‍යාවශ්‍ය නොවන්නේ,
(1) කටහඬ පාලනය
(2) පරිකල්පන ශක්තිය
(3) චරිතයක් තුළට කිඳා බැසීමේ හැකියාව
(4) අලංකාර රූප ශෝබාව

(14) වේදිකා නාට්‍ය හා සම්බන්ධ වන කලා මාධ්‍යයක් නොවන්නේ,
(1) ඡායාරූප කලාව (2) චිත්‍ර කලාව (3) නර්තන කලාව (4) සංගීත කලාව

(15) අනුශාංගික ශිල්පියෙකු නොවන්නේ,
(1) රංගලෝක ශිල්පියා
(2) රංග රචනා ශිල්පියා
(3) පෙළ රචනා ශිල්පියා
(4) අංග රචනා ශිල්පියා

(16) වේදිකා නාට්‍යයක් රංග ගත වන අවස්ථාවේ සිටිය යුතු ම ශිල්පීන් අයත් නොවන්නේ,
(1) රූපන ශිල්පීන්, වේදිකා පාලක
(2) වේදිකා පාලක, රංගා ලෝක ශිල්පීන්
(3) රූපන ශිල්පීන්, රංගාලෝක ශිල්පියා
(4) රූපන ශිල්පීන්, පෙළ රචනා ශිල්පියා

(17) වේදිකා නාට්‍යයේ රංග ශෛලිය හා වඩාත් බැඳී ඇති සාධකය නොවන්නේ,
(1) සංගීතය යි. (2) සංවාදය යි. (3) අංග රචනය යි. (4) රංගා ලෝකය යි.

(18) නළුවරණය යනු,
(1) නළුවන්ට රංගනය කියා දීම ය.
(2) නළුවන් තෝරා ගැනීම ය.
(3) නළුවන්ට දින නියම කිරීම ය.
(4) පළමු වරට නළුවෙකු රංගනයට පිවිසීම ය.

(19) නෘත්ත, නෘත්‍ය, නාට්‍ය සඳහා පිළිවෙලින් උදාහරණ අයත් වන්නේ,
(1) කලගෙඩි නැටුම, මුද්‍රා නාට්‍ය, දික්තල කාලගෝල
(2) තෙල්මේ නැටුම, සවරම් නැටුම, මුද්‍රා නාට්‍ය
(3) බැලේ, ඔපෙරා, මුද්‍රා නාට්‍ය
(4) වෙස් නැටුම, අභිරූපණ, නල දමයන්ති ඉඟි නළුව



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(20) ක්ෂණික නිරූපණයේ දී වඩාත් වැදගත් වන්නේ,
(1) තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම, අවධානය ලබා ගැනීම.
(2) තීරණ ගැනීම, නර්තනය, රූපණය
(3) තීරණ ගැනීම, අවධානය ලබා ගැනීම, ගායනය
(4) ඇඳුම් පැළඳුම්, රංග පසුතල, සංගීතය

(21) රංග භාණ්ඩ සම්බන්ධයෙන් නොගැළපෙන පිළිතුර වන්නේ,
(1) රංග භාණ්ඩ සැහැල්ලු විය යුතු ය. (2) පරිහරණයට පහසු විය යුතු ය.
(3) විචිත්‍ර විය යුතු ය. (4) නාට්‍යෝචිත විය යුතු ය.

- 22 සහ 23 අංක සඳහා නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(22) (1) මැණික්පාල ශාන්තිකර්මය සූනියම් ශාන්තිය ලෙස ද හඳුන්වයි.
(2) සූනියම් යක්ෂණිය පැමිණෙන ශාන්තිකර්මය සූනියම් ශාන්තිය යි.
(3) සූනියම් ශාන්තිකර්මයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ගැට බෙරය යි.
(4) මැණික්පාල ශාන්තිය යනු රත්නපුරයේ ජනප්‍රිය ශාන්තිකර්මයක් වේ.

(23) (1) සූනියම් යාගය ශාන්තිකර්මය උඩරට ව්‍යාප්ත ශාන්ති කර්මයකි.
(2) මෙහි එන සියලු ම චරිත වෙස් මුහුණු පළඳිති.
(3) විශාලා මහනුවර තුන්බිය හා සම්බන්ධ වූ ශාන්තිකර්මය යි.
(4) වඩිග පටුන මෙහි ප්‍රධාන නාට්‍යමය අවස්ථාවකි.

- 24 සිට 26 තෙක් ප්‍රශ්නයන්හි නොගැළපෙන පිළිතුර තෝරන්න.

(24) (1) හිම කන්ද දිය වීම. (2) මෝරා පැමිණීම. (3) ඉටි පන්දම දිය වී වැටීම. (4) අයිස් කැටය ද්‍රව වීම.

(25) (1) දහ අට සන්නිය ශාන්ති කර්මය පහතරට ව්‍යාප්ත එකකි.
(2) දහ අට සන්නියේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය දොවොල් බෙරය යි.
(3) දහ අට සන්නියේ සියලු ම පාත්‍රයින් වෙස් මුහුණු පළඳිති.
(4) වසවර්තියා, විශ්ණු දෙවියන් හා මහාසම්මත රජු හා බැඳුණු පුරාවෘත්තයක් දහ අට සන්නි උපත් කථාව වේ.

(26) (1) කැළණි පාලම, ගුරු තරුව, තට්ටු ගෙවල් (2) මනමේ, හුණුවටයේ කථාව, රජා මං වහලා
(3) හඳයා, සරිගම, මෝදර මෝල (4) සුබ සහ යස, මකරාක්ෂයා, ධවල භීෂණ ග

(27) නාට්‍යයක නළුවකු සංවාද ඉදිරිපත් කිරීමේ දී සැලකිලිමත් නොවිය යුත්තේ,
(1) හඬ ප්‍රක්ෂේපණය යි. (2) හඬ මිහිරි ලෙස භාවිතා කිරීම ගැන ය.
(3) චරිත ස්වභාවය ඉස්මතු කිරීම ගැන ය. (4) භාව ප්‍රකාශනය ගැන යි.

- 28 සිට 31 තෙක් ප්‍රශ්න සඳහා පහත වගුව භාවිත කරන්න.

| නාට්‍යකරු | මුල් කෘතියේ නම | පරිවර්තනය අනුවර්තනය | අධ්‍යක්ෂණය |
|---|---|---|---|
| එව්ගිනිෂ්වාස් | A | මකරා | B |
| ඇරිස්ටොෆොනිස් | වළාකුළු | C | හෙන්රි ජයසේන |
| D | ඉක්නෙව්ටාඉ | බෙරහඬ | E |
| ජූලියස් හේ | F | G | සුගතපාල ද සිල්වා |
| වර්න්ස්හයිඩර් | H | ඇසළ සඳ අවන්හල | I |

(28) "C" අක්ෂරය සඳහා වඩාත් ගැළපෙන නාට්‍යය වනුයේ,
(1) ඇත්ත කුමක් ද? (2) දිරිය මව සහ ඇගේ දරුවෝ
(3) අහස් මාලිගා (4) මනාලයෝ



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(29) A සහ B සඳහා වඩාත් නිවැරදි වනුයේ,
(1) ද බෲගන් - සුගතපාල ද සිල්වා
(2) ද හෝස් - හෙන්රි ජයසේන
(3) ද බෲගන් - බන්දුල ජයවර්ධන
(4) ද බෲගන් - හෙන්රි ජයසේන

(30) "D" සඳහා වඩාත් උචිත වනුයේ,
(1) ඇරිස්ටොෆානිස්
(2) සොෆොක්ලීස්
(3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
(4) ටෙනසි විලියම්ස්

(31) F සහ H අක්ෂර සඳහා අදාළ නාට්‍ය දෙක පිළිවෙලින්,
(1) ද හෝස්, ද වී හවුස් ඔෆ් ද ඕගස්ට් මූන්
(2) මදර් කරේජ්, ද වී හවුස් ඔෆ් ද ඕගස්ට් මූන්
(3) ද හෝස්, ද රයිවල්ස්
(4) දුන්න දුනු ගමුවේ, ද හෝස්

(32) ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කළ නාට්‍ය කරුවකු වන්නේ,
(1) සයිමන් නවගත්තේගම
(2) පරාක්‍රම නිරිඇල්ල
(3) හෙන්රි ජයසේන
(4) සුගතපාල ද සිල්වා

(33) පරාක්‍රම නිරිඇල්ලයන්ගේ වේදිකා නාට්‍යයක් නොවන්නේ,
(1) ගැලීලියෝ
(2) උත්තමාවී
(3) සාන්තුවර සෙබලානෝ
(4) වරෙන්තු

(34) ශ්‍රී ලංකේය නාට්‍ය වංශයේ යථාර්ථවාදී නාට්‍ය සම්ප්‍රදාය මෙරට තහවුරු කළ නාට්‍ය කරුවාගේ ස්වතන්ත්‍ර නාට්‍යයක් නොවන්නේ,
(1) දුන්න දුනු ගමුවේ
(2) දැවැද්දෝ
(3) අපට පුතේ මගක් නැතේ
(4) නන්දි විශාල

(35) හෙන්රි ජයසේන මහතාගේ ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් අයත් වරණය වනුයේ,
(1) සරණ සියොත්සේ පුතුනි හඹා යන, දිරිය මව හා දරුවෝ
(2) මනරංජන වැඩ වර්ජන, වැදගත් කම
(3) අහස් මාලිගා, කුවේණි
(4) ජනේලය, පව්කාරයෝ

(36) මෙම ඡායාරූපයේ දක්වෙන රංගන ශිල්පිනිය රංගනයෙන් දායක වූ නාට්‍ය නිර්මාණය ඇතුළත් වනුයේ,



(1) කුවේණි, හුණුවටයේ කථාව, තාරාවෝ ඉගිලෙති
(2) හුණුවටයේ කථාව, අහස් මාලිගා, රතු හැට්ටකාරි
(3) ජනේලය, කුවේණි, සිංහබාහු
(4) තවත් උදෑසනක්, අහස් මැලිගා, ජනේලය

(37) මෙම ඡායාරූප දෙකෙහි එන රංගන ශිල්පීන් දෙදෙනා වනුයේ,



(1) අනුලා බුලත්සිංහල, චාන්දනී සෙනෙවිරත්න
(2) අනුලා බුලත්සිංහල, කෞෂල්‍යා ප්‍රනාන්දු
(3) කෞෂල්‍යා ප්‍රනාන්දු, චාන්දනී සෙනෙවිරත්න
(4) අයිරාංගනී සේරසිංහ, කෞෂල්‍යා ප්‍රනාන්දු

(38) මෙම ඡායාරූපයේ දක්වෙන රංගන ශිල්පියා හා සාවද්‍ය වනුයේ,



(1) සිනමා සහ රූපවාහිනි නාට්‍ය අධ්‍යක්ෂවරයෙකි.
(2) මනමේ නාට්‍යයේ මනමේ කුමරු ලෙස රංගනයේ යෙදුනි.
(3) තාරාවෝ ඉගිලෙති, මධුර ජවනිකා රංගනයේ යෙදුනු නාට්‍ය වේ.
(4) ගායනා ක්ෂේත්‍රයෙහි ද තම ප්‍රතිභාව දක්වා ඇත.

(39) ගාමිණී සමරකෝන් රංගවේදියා රංගනයේ යෙදුනු නාට්‍යයක් නොවන්නේ,
(1) මනමේ
(2) තාරාවෝ ඉගිලෙති
(3) මූදු පුත්තු
(4) සුබ සහ යස

(40) ඩග්ලස් රණසිංහ රංග ශිල්පියා හා සාවද්‍ය වනුයේ,
(1) ඉංග්‍රීසි නාට්‍ය වේදිකාවේ රංගනයේ යෙදී ඇත.
(2) සිනමාවේ හා රූපවාහිනි රංගනයේ දී වඩාත් කැපී පෙණින.
(3) කුවේණි, ජනේලය, අහස් මාලිගා නාට්‍යයන්හි රංගනයේ යෙදී ඇත.
(4) දක්ෂ චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකි.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

3

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව - II

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 02 යි.

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) අම්බරයේ සඳ සේ දිලි රූපාවතී
නුඹ දක්ක වෙලේ සිට සුන්දරි ආලේ වුණි

(i) ඉහත ගීත කණ්ඩය අන්තර්ගත නාට්‍ය හා අධ්‍යක්ෂවරයා නම් කරන්න. (ලකුණු 02)

(ii) මෙම ගීතය ගායනා කරනු ලබන පාත්‍රයා නම් කරන්න. (ලකුණු 02)

(iii) එම පාත්‍රයාගේ රැකියාව කුමක් ද? (ලකුණු 02)

(iv) මෙම නාට්‍ය රචනයට පාදක වූ ජාතක කථාව හා එය අයත් ග්‍රන්ථය නම් කරන්න. (ලකුණු 02)

(v) මෙම ගීතයෙන් කියැවෙන චරිතය කුමක් ද? එම චරිතයේ චරිත ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(vi) මෙම නාට්‍යයේ දක්නට ලැබෙන නාඩගම් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(02) (i) සංවේදන අභ්‍යාස හා සම්බන්ධ ඉන්ද්‍රියන් 4ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉන් එක් ඉන්ද්‍රියක් හා සම්බන්ධ සංවේදන අභ්‍යාසයක් සිදු කරන අයුරු විස්තර කරන්න. (ලකුණු 05)

(iii) රංග අභ්‍යාසයන්හි නිරත නළුවකුට ලැබෙන වාසි පිළිබඳ ව සඳහන් කරන්න. (ලකුණු 05)

(03) (i) අතීතයේ ලංකාවේ ප්‍රකට රංග භූමි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) රංග භූමි බෙදන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. ඒ සඳහා රංග භූමිය බැගින් උදාහරණ දක්වන්න. (ලකුණු 04)

(iii) රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ 04ක් විස්තර කරන්න. (ලකුණු 06)

(04) • පහතරට ශාන්තිකර්ම අතර රිද්දි යාගය සුවිශේෂී අරමුණු පෙරදැරිව ඉදිරිපත් කරන ලදි.

(i) රිද්දි යාගය පැවැත්වීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) මෙම ශාන්තිකර්මයේ අන්තර් රංග අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉන් එක් අන්තර් රංග අවස්ථාවක නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිත ව විමසන්න. (ලකුණු 06)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(05) (i) කතාන්තරයක හා නාට්‍යයක දැකිය හැකි සමාන ලක්ෂණ 03ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) කතාන්තරයක හා නාට්‍යයක දැකිය හැකි අසමාන ලක්ෂණ 03ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) වෛදිකා නාට්‍ය කලාවේ සුවිශේෂීතා පිළිබඳ ව විමසන්න. (ලකුණු 06)

(06) (i) අංග රචනයේ දී මුහුණ බෙදන ප්‍රධාන කොටස් කීය ද? ඒ මොනවා ද? (ලකුණු 03)

(ii) අංග රචනය බෙදන ප්‍රධාන කොටස් දෙක නම් කර ඒ පිළිබඳ ව හඳුන්වන්න. (ලකුණු 04)

(iii) අංග රචනයේ දී භාවිත වන අමු ද්‍රව්‍ය 05ක් නම් කර ඒවායේ කාර්යය කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(07) "පාසල නිම වී නිවසට පැමිණි ඔබට තම බෑගයේ තිබී පාර්සලයක් හමු වේ. ඔබ එය දැකීමෙන් අනතුරුව..."

ඉහත සිදුවීම පාදක කර ගනිමින් රංගනයට උචිත කෙටි නාට්‍ය පෙළක් රචනා කරන්න.

නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය, පරිකල්පනය සඳහා (ලකුණු 06)

චරිත තෝරා ගැනීම, රංග විධාන හා සංවාද භාවිතය (ලකුණු 06)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk